පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක 492

ආයතනයේ නම : කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4)

යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

பாராளுமன்ற வினா இலக்கம் 492

நிறுவனத்தின் பெயர்: தொழில்நுட்பக் கல்வி மற்றும் பயிற்சித் திணைக்களம்

பாராளுமன்றத்தில் அரச கணக்குகள் தொடர்பான செயற்குழுவினால் சமர்ப்பிக்கப்பட்ட அறிக்கைகள் தொடர்பில் நிலையியற் கட்டளை இலக்கம் 119(4) இன் கீழ் கௌரவ அமைச்சரது அவதானிப்புக்கள் மற்றும் எடுக்கப்பட்ட நடவடிக்கைகள் குறித்த விபரங்களை பாராளுமன்றத்திற்கு சமர்ப்பித்தல்.

Parliamentary Series No : 492

Name of the institution : Department of Technical Education & Training

Submission of observations of Hon. Minister and steps taken with regard to the reports tabled by the Committee on Public Accounts in terms of Standing Order No .119(4)

ආකෘති පත්‍ර (අංක 01)

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක 492

ආයතනයේ නම: කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව

පළමු කොටස : 77.00

	වාර්තාව මඟින් හඳුනාගත් අඩුපාඩු	අඩුපාඩු නිවැරදි කිරීම සඳහා ආයතනය විසින් ගත් ක්‍රියාමාර්ග / වත්මන් තත්ත්වය
01	විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම මසක් තුළ පිළිතුරු සපයා නොතිබුණි.	මෙම දෙපාර්තමේන්තුව ප්‍රධාන කාර්යාලය හා කාර්මික/තාක්ෂණ විද්‍යාල 39 කින් යුත් දෙපාර්තමේන්තුවක් වන අතර විගණන විමසුම් සඳහා එක් එක් විද්‍යාල වලින් පිළිතුරු ගෙන්වා ගෙන එය විගණන විමසුමට උචිත පරිදි සකස් කර ගැනීම සඳහා සැලකිය යුතු කාලයක් ගතවේ. කෙසේ වුවත් හැකි ඉක්මනින් විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීමට කටයුතු කරමි.
02	අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් තුළ පිළිතුරු නොසැපයූ අවස්ථා වාර්තා විය.	මෙම දෙපාර්තමේන්තුව ප්‍රධාන කාර්යාලය හා කාර්මික/තාක්ෂණ විද්‍යාල 39 කින් යුත් දෙපාර්තමේන්තුවක් වන අතර විගණන විමසුම් සඳහා එක් එක් විද්‍යාල වලින් පිළිතුරු ගෙන්වා ගෙන එය විගණන විමසුමට උචිත පරිදි සකස් කර ගැනීම සඳහා සැලකිය යුතු කාලයක් ගතවේ. කෙසේ වුවත් හැකි ඉක්මනින් විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීමට කටයුතු කරමි.
03	මු. රෙ. 134 (3) ප්‍රකාරව අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	අභ්‍යන්තර විගණන වාර්තා විගණකාධිපති වෙත යොමු කිරීමට කටයුතු කර ඇත.
04	2020.08.28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 1 කොටසේ 11.1 ඡේදයේ සඳහන් කාල රාමුව ඇතුළත මු. රෙ. 756 (6) ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණය කර නියමිත දිනට අදාළ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	මෙම දෙපාර්තමේන්තුව ප්‍රධාන කාර්යාලය ඇතුළු දීප ව්‍යාප්තව පිහිටි කාර්මික/තාක්ෂණ විද්‍යාල 39 කින් සමන්විත අධ්‍යාපන ආයතනයකි. චක්‍රලේඛ ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණ සිදු කළ යුතු කාල රාමුව තුළ විද්‍යාලවල සිසුන් බඳවා ගැනීමේ කටයුතු සිදු වන බැවින් භාණ්ඩ සමීක්ෂණ කටයුතු සඳහා නිලධාරීන් යොදවා ගැනීමේ ප්‍රායෝගික ගැටලුවක් පවතින බැවින් නියමිත කාල රාමුව තුළ සිදුකර අවසන් කිරීමේ අපහසුතාවයක් පවතී. එසේ වුවද චක්‍රලේඛ ප්‍රකාරව නියමිත කාලරාමුව තුළ අදාළ භාණ්ඩ සමීක්ෂණයන් සිදුකර අදාළ වාර්තා විගණකාධිපති වෙත යැවීමට හැකි උපරිමයෙන් කටයුතු කරන බව කාරුණිකව දන්වමි.
05	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා පිළිබඳව වන නිර්දේශද අනෙකුත් නිර්දේශද නියමිත කාල වකවානු තුළ ක්‍රියාත්මක කර නොතිබුණි.	කාර්මික/තාක්ෂණ විද්‍යාල මඟින් අදාළ භාණ්ඩ සමීක්ෂණ වාර්තා එවීමේදී සිදු වන ප්‍රමාදය මත මෙම තත්ත්වය උද්ගතවී ඇත. කෙසේ වෙතත් හැකි උපරිමයෙන් භාණ්ඩ සමීක්ෂණ වාර්තා ගෙන්වාගෙන එහි නිර්දේශ නියමිත කාලසීමාව තුළ නිම කිරීමට කටයුතු කරමි.
06	සියලු වාහනවල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොතිබුණි.	2026 වර්ෂය තුළ දී දෙපාර්තමේන්තුව සතු වාහන වල රාජ්‍ය ලාංඡන පින්තාරු කිරීමට ප්‍රතිපාදන සලසා ගෙන ඇති අතර එය කඩිනමින් අවසන් කිරීමට කටයුතු කරමි.

D. Wathsala Marambage
Director General
Department of Technical Education & Training
P.O.Box 557, Olcott Mawatha,
Colombo 10

<table>
<tr><td>07</td><td>රජයේ වාහන අනතුරු සම්බන්ධයෙන් මු. රෙ. ප්‍රකාරව නිසි කටයුතු කර නොතිබුණි.</td><td>රජයේ වාහන අනතුරු සම්බන්ධව පරීක්ෂණ පවත්වා මු.රෙ. ප්‍රකාරව අදාළ අලාභයන් අයකර ගැනීමට හෝ පොත් වලින් කපා හැරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත.</td></tr>
<tr><td>08</td><td>වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුනි.</td><td>2023 වර්ෂයේ පැවති වසරකට වැඩි කාලයකට අදාළ ණය ශේෂ නිරවුල් කිරීමේ ප්‍රගතිය පහත දැක්වේ. නිරවුල් නොවී පවතින ශේෂ හැකි ඉක්මනින් නිරවුල් කිරීමට කටයුතු කරමින් පවතී.
<table>
<tr><th>විස්තරය</th><th>2023 පැවති ශේෂය</th><th>එම ශේෂයෙන් නිරවුල් වූ වටිනාකම</th><th>2025.12.31 දිනට ඉතිරි ශේෂය</th></tr>
<tr><td>මිය ගිය</td><td>566,703.50</td><td>480,943.50</td><td>85,760.00</td></tr>
<tr><td>විශ්‍රාම ගිය</td><td>2,507,696.72</td><td>2,357,841.72</td><td>149,855.00</td></tr>
<tr><td>වැඩ තහනම් කළ</td><td>26,765.00</td><td>-</td><td>26,765.00</td></tr>
<tr><td>සේවය අතහැර ගිය</td><td>992,287.25</td><td>40,672.00</td><td>951,615.25</td></tr>
<tr><td>සේවය අවසන් කළ</td><td>210,905.00</td><td>-</td><td>210,905.00</td></tr>
<tr><td>සේවයෙන් පහ කළ</td><td>745,033.00</td><td>30,000.00</td><td>715,033.00</td></tr>
<tr><td></td><td>5,049,390.47</td><td>2,909,457.22</td><td>2,139,933.25</td></tr>
</table></td></tr>
<tr><td>09</td><td>පොදු තැන්පත් ගිණුමේ කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු. රෙ. 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.</td><td>මේ වන විට කල් ඉකුත් වූ තැන්පතු ශේෂ නොමැති බව කාරුණිකව දන්වා සිටිමි.</td></tr>
<tr><td>10</td><td>මු. රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්ත්කාර්ය අතුරු අග්‍රිම කාර්ය නිම වී මාසයක් ඇතුළත නිරවුල් කර නොතිබුණි.</td><td>ලබා දී ඇති තත්ත්කාර්ය අතුරු අග්‍රිම අදාළ කාර්යය නිමවූ විගස නිරවුල් කිරීමට කටයුතු කරමි.</td></tr>
<tr><td>11</td><td>රැස්කර තිබුණු ආදායම්, සෘජුවම ආදායමට බැර කර හෝ ඒවා තැන්පත් ගිණුමේ රඳවා ගෙන මාසයකට වඩා අඩු කාලයක් ඇතුළත ආදායම් ගිණුමට බැර කර හෝ නොතිබුණි.</td><td>සියලුම ආදායම් සෘජුවම රාජ්‍ය ආදායමට බැර කිරීමට මේ වන විට කටයුතු කර ඇත.</td></tr>
</table>

7/14

ඩී. වත්සලා මාරඹගේ
අධ්‍යක්ෂ ජනරාල්
කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව
තැ.පෙ. 557, ඕල්කොට් මාවත,
කොළඹ - 10

ආකෘති පත්‍ර (අංක 01)

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක **492**

ආයතනයේ නම: කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව

දෙවැනි කොටස : **69.00**

	වාර්තාව මගින් හඳුනාගත් අඩුපාඩු	අඩුපාඩු නිවැරදි කිරීම සඳහා ආයතනය විසින් ගත් ක්‍රියාමාර්ග / වත්මන් තත්ත්වය
01	2018.01.24 දිනැති අංක 05/2018 (1) දරණ චක්‍ර ලේඛයෙන් සංශෝධිත 2008.02.06 දිනැති අංක 05/2008 දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ චක්‍රලේඛය ප්‍රකාරව පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය නිසි පරිදි පිළියෙල කර ක්‍රියාත්මක කර නොතිබුණි.	නිරීක්ෂණය පිළිගනිමි. අප දෙපාර්තමේන්තුවේ දැක්ම, මෙහෙවර හා අරමුණු ළඟා කර ගත හැකි පරිදි එක් එක් අංශයන් විසින් සකස් කරන ලද පුරවැසි / සේවාලාභී ප්‍රඥප්ති යාවත්කාලීන කිරීමේ කටයුතු දැනටමත් (2025 / 2026 වර්ෂයන් තුළ) ආරම්භ කර සිදු කරමින් පවතී. ඉදිරි වර්ෂයන්හිදී එම අඩුපාඩු මගහරවා පුරවැසියාට නිසි සේවයක් සැපයීමට සහතික කෙරෙන ආකාරයට අදාළ කටයුතු සිදු කිරීමට පියවර ගන්නා බවට මෙයින් කාරුණිකව දන්වා සිටිමි.
02	ආයතනයේ පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම පිළිබඳ අධීක්ෂණය කිරීමට හෝ ඇගයුමට භාජනය කිරීමට ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි.	නිරීක්ෂණය පිළිගනිමි. ආයතනයේ පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම පිළිබඳ අධීක්ෂණය කිරීමට හා ඇගයීම් කිරීමට ප්‍රමාණවත් ක්‍රමවේදයක්ද සකස් කිරීම මේ වන විටත් ආරම්භ කර ඇති අතර, ඉදිරි වර්ෂයන්හිදී එම අඩුපාඩු මගහරවා පුරවැසියාට නිසි සේවයක් සැපයීමට සහතික කෙරෙන ආකාරයට අදාළ කටයුතු සිදු කිරීමට පියවර ගන්නා බවට මෙයින් කාරුණිකව දන්වා සිටිමි.
03	ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, යටත්ව මට්ටමේ / ව්‍යාවන මට්ටමේ / අහිතකර මට්ටමේ විය.	තත්වාගණනය කළ (යටත්ව මට්ටමේ) විගණන මතයකි.

7/14

ඩී. වත්සලා මාරඹගේ
අධ්‍යක්ෂ ජනරාල්
කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව
තැ.පෙ. 557, ඕල්කොට් මාවත,
කොළඹ - 10

04	උපරිම සේවා කාලය සම්පූර්ණ කරන ලද නිලධාරීන් නිසි පරිදි ස්ථා මාරු කර යැවීමට කටයුතු කර නොතිබුණි.	➢ <u>කාර්මික අධ්‍යාපන සේවය</u> - කාර්මික අධ්‍යාපන සේවයේ නිලධාරීන් විවිධ ක්ෂේත්‍ර අනුව බඳවා ගනු ලබයි. ස්ථාන මාරු කිරීමේදී එක් එක් කාර්මික විද්‍යාල / තාක්ෂණ විද්‍යාල ක්‍රියාත්මක වන පාඨමාලාවට අනුකූල වන සේ ස්ථාන මාරු සිදු කළ යුතුයි. සේවා කාලය පමණක් සලකා ස්ථානමාරු කළ හොත් පාඨමාලා අඛණ්ඩව පවත්වාගෙන යාමේ ගැටළුවක් මතුවේ. උදාහරණයක් ලෙස ස්වර්ණාභරණ පාඨමාලාව පැවැත්වෙන්නේ මරදාන තාක්ෂණ විද්‍යාලයේ සහ බෙලිඅත්ත කාර්මික විද්‍යාලයයේ පමණි. එවිට උපදේශක (ස්වර්ණාභරණ) ස්ථානමාරු කළ හැක්කේ එම විද්‍යාල දෙක අතර පමණි. ➢ <u>ඒකාබද්ධ සේවය</u> - ඒකාබද්ධ සේවයේ ස්ථානමාරුවීම් සඳහා සුදුසුකම් ලබන නිලධාරීන්ගේ ඉල්ලීම් හා සුදුසුකම් ලබා ඇති නිලධාරීන්ගේ තොරතුරු ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමුකරනු ලැබුවද අදාල ස්ථානමාරු නියෝග සියළුම නිලධාරීන්ට නොලැබීම මත ඔවුන් මෙම සේවා ස්ථානයේම වැඩි සේවා කාලයක් රැඳී සිටින තත්ත්වයක් ඇත. මෙය ලැබෙන මාරු නියෝග මත රඳා පවතින තත්ත්වයකි. ➢ <u>දෙපාර්තමේන්තුගත සේවය</u> - දෙපාර්තමේන්තුගත නිලධාරීන්ගේ ස්ථානමාරු පටිපාටිය විධිමත්ව ක්‍රියාත්මක නොකිරීම වැඩි සේවා කාලයන් සහිත නිලධාරීන් දෙපාර්තමේන්තුව තුල රැඳී සිටින බවට වූ විගණන නිරීක්ෂණය පිළිගනිමි. එසේවුවද මෙම නිලධාරීන් සේවා අවශ්‍යතාවයන් මතද , නිලධාරීන් විසින් ඉදිරිපත් කරනු ලබන සිය පෞද්ගලික අපහසුතා (ප්‍රවාහන / ආර්ථික / නේවාසික පහසුකම් හා අසනීප තත්ත්වයන්) මත කරනු ලබන ඉල්ලීම් පිලිබඳ සානුකම්පිතව සලකා බලා අවස්ථානුකූලව ගනු ලබන නිරීක්ෂණයන් මත මෙම නිලධාරීන් තවදුරටත් එම ආයතන තුලම රැඳී සිටීමට අවස්ථාව ලබාදී ඇතත් ඉදිරියේදී ස්ථාන මාරු නියෝග ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන බව දන්වමි.

ඩී. චන්සලා මාරසිංහ
අධ්‍යක්ෂ ජනරාල්
කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව
තැ.පෙ. 557, ඕල්කොට් මාවත,
කොළඹ - 10